**අජිත් ගුණවර්ධන එ. ලංකා විදුලිබල මණ්ඩලය**

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 991 /2019 (2019.05.14 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල

**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ  කිෂාලි පින්ටෝ ජයවර්ධන

**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ  එස්. ජී. පුංචිහේවා

**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - අජිත් ගුණවර්ධන

**නොතිසි ලත් පාර්ශවය** - නම් කළ නිලධරයා ලංකා විදුලිබල මණ්ඩලය

**පෙනීසිටීම**

අභියාචක - අජිත් ගුණවර්ධන

පොදු අධිකාරිය - එච් ජේ ඉන්දික ප්‍රනාන්දු (කළමනාකරණ)

පී එච් ජේ සොයිසා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.10.19 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2018.11.19 |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.11.25 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | No Response (තොරතුරු ඉල්ලා සිටීම පිළිබඳ අභියාචනය ලද බව දැන්වීම) |

| | |
|---|---|
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.12.20 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2018.10.19 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

*අභියාචක විසින් ගරු විදුලිබල ඇමතිතුමාට ලිඛිතව කරන ලද පැමිණිල්ලකට අනුව ලංවිම විමර්ශන ඒකකය ඇමතිතුමාගේ උපදෙස් මත පැවැත්වූ පරීක්ෂණය CEB/SIB/SI/2484 පිළිබඳව තොරතුරු දැන ගැනීම සඳහා මෙම ලිපිය ඉදිරිපත් කර ඇත.*

1. *ඉහත විශේෂ විමර්ශන ඒකකය මගින් පැවැත්වූ පරීක්ෂණයෙන් අනාවරණය වූ කරුණු පිළිබඳ වාර්තාවේ සහතික පිටපතක්*
2. *මෙම වාර්තාව පැමිණිලිකරු වන අභියාචකහට ලබා දිය නොහැකි නම් එයට හේතු*
3. *මෙම පරීක්ෂණයට අනුව ලංවිම සේවකයන් වරදකරු වී ඇත්නම් ඔවුන්ගේ නම් සහ ඔවුන්ට විරුද්ධව ගෙන ඇති විනයානුකුල ක්‍රියාමාර්ග පිළිබඳ විස්තරයක්*
4. *මෙලෙස අභියාචකගේ තොග විදුලිය විසන්ධි කර උපකරණ ගලවා ගෙන යාම ලංවිම නීතිරීති වලට එකඟද නැද්ද යන්න*
5. *ඉහත ගෙවීම් වවුචර් අංක 185897-88 සහ අනෙකුත් අදාළ මුදල් ගෙවීමෙන් පසුව ගිණුම් අංක 2870101473(Old A/C N o : 0097284541) යටතේ තොග විදුලිය සැපයීමට ලංවිම හා පාරිභෝගිකයා අතර අත්සන් කරන ලද ගිවිසුමේ සහතික පිටපතක් සහ එම පාරිභෝගිකයා විසින් තමාට තොග සැපයුමක් ලබා දෙන ලෙස ලංවීමට ඉදිරිපත් කළ ඉල්ලීමේ සහතික පිටපතක්*
6. *ඉහත 5 යටතේ ඉල්ලුම් කල ලේඛණ ලබා දිය නොහැකි නම් එයට හේතු*

තොරතුරු නිලධාරියා 2018.11.19 දිනැතිව පහත පරිදි පිළිතුරු සපයන ලදී.

- *ඔබගේ උක්ත ලිපියේ සඳහන් තොරතුරු ඉල්ලුම් අංක 1-4 දක්වා තොරතුරු අදාළ ගිණුම පවත්වාගෙන යන ඒකකය සහ අදාළ ශාඛාව සතුව නොමැති බව දැනුම් දී ඇති බැවින් එය විශේෂ විමර්ශන ඒකකය වෙතින් ලබා ගත යුතු වේ.*
- *ඔබ විසින් දක්වා ඇති තොරතුරු ඉල්ලුම් අංක 5-6 දක්වා පිළිතුරට අදාළ වනුයේ එන 287010473 දරන විදුලි ගිණුමට වන බවත් මෙම විදුලි ගිණුමට අදාළ ගිවිසුම අත්සන් කර ඇත්තේ තොරතුරු ඉල්ලා සිටින ඔබ විසින් නොවන බවත් අදාළ ශාඛාව මඟින් මා වෙත දැනුම් දී ඇත. එමෙන්ම ගිණුම්*

*හිමියා විදේශික කාන්තාවකි. වෙනත් අයකුගේ විදුලි ගිණුමක තොරතුරු බාහිර පාර්ශවයකට ලබා දෙන්නේ නම් ගිණුම් හිමියාගේ අවසරය/කැමැත්ත අවශ්‍ය වේ. නොඑසේ නම් යම් විශේෂ තීන්දුවක් විය යුතු වේ.*

මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2018.11.25 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.12.20 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

පොදු අධිකාරියෙහි නම්කළ නිලධරයා 2018.12.24 වැනි දින ඇය වෙත සිදු කරන ලද අභියාචනයට ප්‍රතිචාර දක්වමින් පවසා සිටින ලද්දේ ඉල්ලා සිටින තොරතුරුවලට අදාළව අධිකරණමය ක්‍රියාවක් සිදුකෙරෙමින් පවතින බැවින් එම තොරතුරු ලබා දිය නොහැකි බවත් අංක 1 හා 3 යටතේ ඉල්ලා ඇති තොරතුරු පනතේ 5 (1) (අ) සහ 5 (1) (උ) වගන්ති ප්‍රකාරව සහ අංක 5 යටතේ ඉල්ලා ඇති තොරතුරු පනතේ 5 (1) (එ) වගන්තිය ප්‍රකාරවත් ලබා දිය නොහැකි බවයි.

දෙපාර්ශ්වයම පැමිණ සිටින ලදී.

ඉල්ලා ඇති තොරතුරු විමර්ශනය අවසන් වූ විටද, තෙවැන පාර්ශ්වයන්ට අදාළ තොරතුරු එම පාර්ශ්වයෙහි කැමැත්ත ලබා ගනීමෙන් අනතුරුවද ලබා දෙන බවද පොදු අධිකාරිය දන්වා ඇත.

අභියාචක කරුණු දක්වමින් පවසා සිටියේ මෙම විමර්ශනය තමා පොදු අධිකාරිය වෙත සිදු කරන ලද පැමිණිල්ලක් මත පැවැත්වූ බවත් ඒ හේතුවෙන් මෙම තොරතුරු ලබා ගැනීම සඳහා තමාට අයිතියක් ඇති බවයි. පොදු අධිකාරිය මීට ප්‍රතිචාර දක්වමින් පවසා සිටියේ මූලික විමර්ශනය පවත්වීමෙන් අනතුරුව විධිමත් විනය පරීක්ෂනයක් ආරම්භ කළද එයට එරෙහිව එම පුද්ගලයා අභියාචනාධිකරණයේ නඩුවක් ගොනු කොට එම විධිමත් පරීක්ෂණය පැවැත්වීම තාවකාලිකව අත්හිටුවීමට වාරණ නියෝගයක් ලබා ගත් බවයි.

අභියාචනා විභාගයේදී පොදු අධිකාරිය කරුණු දක්වමින් තොරතුරු නිලධරයා දැක්වූ ප්‍රතිචාරය නැවත සඳහන් කර සිටින ලදී. තවදුරටත් කරුණු දක්වමින් පොදු අධිකාරිය පවසා සිටියේ පොදු අධිකාරියෙහි නීති අංශයෙන් ලැබුණු උපදෙස් මත තොරතුරු මෙම ප්‍රතිචාර දැක්වූ බවයි. තවද නීති අංශයෙන් නීති නිලධරයා විසින් ලැබුණු ප්‍රතිචාර ප්‍රකාරව පනතේ 5 (1) (අ), 5 (1) (උ) සහ 5 (1) (එ) වගන්ති ප්‍රකාරව තොරතුරු ඉල්ලීමෙහි අයිතම 1 සහ 3 ලබා දිය නොහැකි බව සඳහන් කර සිටින ලදී. අයිතම අංක 5 තෙවන පාර්ශ්වයකට අදාළ තොරතුරක් බැවින් එම පාර්ශ්වයෙහි කැමැත්ත විමසා ලදුව එම තොරතුරු ලබා දීමට තෙවන පාර්ශ්වය විරුද්ධ වූ බව පොදු අධිකාරිය පවසා සිටින ලදී.

මෙම අවස්ථාවේදී මෙම පැමිණිල්ල අභියාචකට සිදුවී ඇති අගතියක් මත සිදු කරන ලද්දක් බැවින් මෙම තොරතුරු ඉල්ලීමෙහි සාධාරණත්වයක් ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර සිටින ලදී. තවද මෙම කරුණට අදාළව නඩු නිමිත්තක් පවතින බැවින් පනතේ 5 (1) (ඒ) වගන්තිය අදාළ විය හැකි බව නිරීක්ෂණය විය. 1 සහ 3 තොරතුරු අයිතම, තෙවන පාර්ශවයක් විසින් රහසිගතව සපයන ලද තොරතුරු නොවන බැවින්, 5 (1) (එ) වගන්තිය අදාළ නොවන බව නිරීක්ෂණය විය.

පොදු අධිකාරියෙන් මෙම විමර්ශන් වාර්තාව කොපමණ දීර්ඝ වාර්තාවක් වන්නේද යන්න විමසා සිටි අවස්ථාවේදී පවසා සිටියේ එය පිටු 50ක් පමණ වන බවයි.

**නියෝගය:**

පනතේ 5 (1) (අ) වගන්තිය ප්‍රකාරව,

> *පුද්ගලික තොරතුරුවලට අදාළ තොරතුරු සම්බන්ධයෙන් වන විට, තොරතුරු හෙළිදරව් කිරීම යම් පොදු කටයුත්තක් හෝ සම්බන්ධතාවක් සඳහා කිසිදු සම්බන්ධයක් නොමැති අවස්ථාවක දී හෝ යම් තනි පුද්ගලයකුගේ පුද්ගලිකත්වය අනවසරයෙන් ආක්‍රමණය කිරීමක් සිදුවේ නම්, එම තොරතුරු හෙළිදරව් කිරීම විශාල වශයෙන් මහජන සුභසිද්ධිය විසින් සාධාරධෑකරණය කරයි නම්, හෝ අදාළ තැනැත්තා විසින් එම හෙළිදරව් කිරීම සඳහා ලිඛිතව කැමැත්ත ලබා දී ඇත්නම් මිස,*

තොරතුරු හෙළිදරව් කළ නොහැකිය. ඒ අනුව එම විමර්ශන වාර්තාව මගින් තෙවන පාර්ශ්වයකගේ පෞද්ගලිකත්වයට බලපෑමක් සිදු විය හැකි බැවින් එම පාර්ශ්වයන්ගේ නම් ඉවත් කොට වාර්තාවී සාරාංශයක් ලබා දීමේ හැකියාව පිළිබඳව පොදු අධිකාරියට උපදෙස් ලබා ගැනීමට නියෝග කරනු ලැබේ.

තවද පොදු අධිකාරිය සඳහන් කර සිටින සමහර වගන්ති අදාළ නොවන බැවින් සහ වෙනත් වගන්ති ප්‍රකාරව තොරතුරු මුක්ත විය හැකි බැවින් පනතෙහි කවර වගන්ති ප්‍රකාරව තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ දැයි උපදෙස් ලබා ගෙන නැවත කරුණු දැක්වීමට නියෝග කරනු ලැබේ. මෙම විමර්ශනය අභියාචක විසින් කරන ලද පැමිණිල්ලක් මත ආරම්භ කළ බැවින් අභියාචක වෙත විමර්ශන් වාර්තාවෙහි මෙම සාරාංශය ලබා දීමේ හැකියාව පිළිබඳවද උපදෙස් ලබා ගන්න ලෙසට නියෝග කරනු ලැබේ.

මීළඟ විභාග කිරීමේ දිනය: 2019.08.27

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

*****